# ***අන්වේෂණා*** ශාස්ත්‍රීය සංග්‍රහය- 2020

1. ***අන්වේෂණා*** සවිද්වත් සමාලෝචිත ශාස්ත්‍රීය සංග්‍රහය කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය විසින් නිකුත් කරනු ලබන ශාස්ත්‍රීය සංග්‍රහය යි.

2. ශාස්ත්‍රීය සංග්‍රහය නිකුත් කරනු ලබන්නේ වසරකට කලාප දෙකක් වශයෙනි.

3. බුද්ධධර්මය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි හා බෞද්ධ සංස්කෘත වැනි බෞද්ධ අධ්‍යයන හා සබැඳි විෂයයන් පිළිබඳ පර්යේෂණාත්මක ලිපි ***අන්වේෂණා*** ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළකෙරේ.

4. ග්‍රන්ථ විචාර හා ලිපි විචාර ද ශාස්ත්‍රීය සංග්‍රහයෙහි ප්‍රකාශයට පත්කිරීම සඳහා භාරගැනේ.

5. මෙම ප්‍රකාශනය සවිද්වත් සමාලෝචිත ශාස්ත්‍රීය සංග්‍රහයකි. එබැවින් ශාස්ත්‍රීය සංග්‍රහයේ පළකිරීම සඳහා එවනු ලබන සෑම ලිපියක් ම අදාළ විෂය-ක්ෂේත්‍රයෙහි විශේෂඥ විද්වතුන් දෙදෙනෙකුගේ සමාලෝචනයට භාජනය කෙරෙන අතර, පළ කිරීම සඳහා ලිපි තෝරා ගනු ලබන්නේ එම විද්වතුන් විසින් ඉදිරිපත් කරනු ලබන ඇගයීම් වාර්තාවල නිර්දේශ ඇතොත් එම නිර්දේශ අනුව අදාළ සංස්කරණ කිරීමෙන් අනතුරුව ය.

6. ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ශාස්ත්‍රීය සංග්‍රහයේ පිටපත් දෙකක් ලේඛකයන්ට ප්‍රදානය කෙරෙනු ඇත.

7. ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපි ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධ සෑම කරුණකදී ම අන්වේෂණා සංස්කාරක මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන්නේ ය.

8. පළකිරීම සඳහා එවනු ලබන පර්යේෂණ ලිපියේ මෘදු පිටපත **2020 මාර්තු 15** දින හෝ ඊට පෙර pgipbs.journal.kln@gmail.com යන විද්‍යුත් ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

9. ලිපි රචනයේ දී පහත සඳහන් උපදෙස් පිළිපැදීමට කාරුණික වන්න.

- MS Word පරිගණක මෘදුකාංගය මගින් පර්යේෂණ ලිපිය සකස් විය යුතු ය.
- ලිපිය A4 ප්‍රමාණයේ පිටු 10 ත් 12ත් අතර විය යුතු ය.
- ලිපියේ පේළි අතර පරතර 1.5 ක් විය යුතු ය.
- සිංහල අක්ෂර සඳහා FM අභය පරිගණක අක්ෂර වර්ගය භාවිත කළ යුතු ය. ඉංග්‍රීසි අක්ෂර සඳහා Times New Roman පරිගණක අක්ෂර වර්ගය භාවිත කළ යුතු ය.
- ප්‍රධාන මාතෘකාවේ අක්ෂර ප්‍රමාණය (Font Size) 14 විය යුතු අතර අනෙකුත් අනුමාතෘකා පරිගණක අක්ෂර 12 ප්‍රමාණයට තද කලු පැහැයෙන් (Bold) දැක්විය යුතු ය. ලිපියේ අන්තර්ගතය සඳහා පරිගණක අක්ෂර 12 ප්‍රමාණය භාවිත කළ යුතු ය.
- මූලාශ්‍රය දැක්වීම සඳහා **හාවර්ඩ් ක්‍රමයේ** (Harvard Referencing Style) **2019 වර්ෂයේ යාවත්කාලීන කරන ලද මාර්ගෝපදේශ පිටපත භාවිත කළ යුතු ය.**
- උද්ධෘත සහ උපුටා ගැනීම් සඳහන් කිරීමේදී ආන්තික සටහන් (Endnotes) භාවිත කළ යුතු ය.
- ලිපියත් සමග සාරසංක්ෂේපයක් (Abstract) ද එහි ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඉදිරිපත් කළ යුතු ය.
- සම්පූර්ණ කරන ලද පර්යේෂණ ලිපියේ මුද්‍රිත පිටපතක් ද පහත දැක්වෙන ලිපිනය වෙත යොමු කළ යුතු ය.

සංස්කාරක මණ්ඩලය
අන්වේෂණා ශාස්ත්‍රීය සංග්‍රහය
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
113, දුටුගැමුණු වීදිය, කොහුවල